World Telecommunication & Information Society Day
17 May 2026

Digital lifelines

Strengthening resilience in a connected world

අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය

අනුර කුමාර දිසානායක
ජනාධිපති,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) 161 වන සංවත්සරයත් සමඟින් 2026 වසරේ ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය (WTISD) සැමරීම සඳහා ශ්‍රී ලංකාව ද ගෝලීය ප්‍රජාව සමඟ එක්වන මොහොතේ මෙම පණිවිඩය ලබා දීමට ලැබීම පිළිබඳ මම සතුටු වෙමි.

මෙම වසරේ තේමාව වන "ඩිජිටල් ජීවනාලිය: ජාලගත ලෝකයක් තුළ ඔරොත්තු දීමේ හැකියාව සවිමත් කිරීම" යන්නෙන් නූතන සමාජයේ තිරසාරභාවය පවත්වාගෙන යාම සඳහා ඔරොත්තු දෙන සහ සුරක්ෂිත ඩිජිටල් යටිතල පහසුකම්වල ඇති ප්‍රතික්ෂේප කළ නොහැකි කාර්යභාරය අවධාරණය කෙරේ. එමඟින් අර්ථවත් සහ විශ්වීය සම්බන්ධතාවන්හි වැදගත්කම ඉස්මතු කරන අතරම, ඕනෑම තත්ත්වයක් යටතේ පුද්ගලයන්ට, ප්‍රජාවන්ට සහ ආර්ථිකයන්ට එකිනෙකා සමඟ සම්බන්ධව සිටීමට සහ කටයුතු කිරීමට ඉඩ හසර ලබා දේ.

අද ලෝකයේ, ඩිජිටල් ජාල සහ සේවාවන් දෛනික ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව ඇත. භෞතික ජාල, සබ්මැරීන් කේබල්, චන්ද්‍රිකා පද්ධති, දත්ත මධ්‍යස්ථාන සහ ඩිජිටල් වේදිකා බොහෝ අංශ ඔස්සේ අත්‍යවශ්‍ය සේවාවන් සැපයීම සඳහා සහාය වේ. සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, මූල්‍ය, ප්‍රවාහනය, රාජ්‍ය පරිපාලනය සහ ආපදා ප්‍රතිචර සේවා වැනි වැදගත් ක්ෂේත්‍ර ද මීට ඇතුළත් වේ. මෙම ඩිජිටල් දාමයේ ඕනෑම කොටසක බිඳ වැටීමක් සමාජ සහ ආර්ථික ක්‍රියාකාරකම් මත දැඩි බලපෑම් ඇති කළ හැකිය. ස්වාභාවික විපත්, අයහපත් කාලගුණික තත්ත්ව, සයිබර් තර්ජන සහ තාක්ෂණික බිඳවැටීම් මගින් දෛනික ජීවිතයට, මහජන ආරක්ෂාවට සහ ආර්ථික ස්ථාවරභාවයට බලපෑම් ඇති විය හැකි බැවින් ඩිජිටල් ස්ථායිතාව ජාතික ප්‍රමුඛතාවක් ලෙස සැලකීම අත්‍යවශ්‍ය වේ.

2030 ඩිජිටල් ආර්ථික උපාය මාර්ගයට අනුව, ශ්‍රී ලංකාව සිය පුළුල් ඩිජිටල් පරිවර්තනයක් කරා වූ න්‍යාය පත්‍රයේ මූලික අංගයක් ලෙස ඩිජිටල් ස්ථායිතාව සලකයි. රටක් ලෙස අප සියලුම දෙනා ඇතුළත් සහ ගෝලීය වශයෙන් ඒකාබද්ධ ඩිජිටල් අනාගතයක් කරා ගමන් කරන විට, විශ්වාසදායී ඩිජිටල් යටිතල පහසුකම්, සන්නිවේදන සේවාවල අඛණ්ඩතාව සහ සයිබර් ආරක්ෂාව කෙරෙහි වඩා වැඩි අවධානයක් යොමුකර ඇත. හදිසි අවස්ථාවලදී ඩිජිටල් පද්ධති ක්‍රියාත්මකව පවත්වා ගැනීම, ඒවා යථා තත්ත්වයට පත් කිරීම සහ මහජන සේවාවන් අඛණ්ඩව ලබා දීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම සන්දර්භය තුළ, ආපදා අවස්ථාවලදී සන්නිවේදන ජාල කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීම සහ හදිසි සන්නිවේදන පහසුකම් ශක්තිමත් කිරීමට ගනු ලබන ප්‍රයත්නයන්, ශ්‍රී ලංකාව මෙම අභියෝගයට මුහුණදීමේ සාර්ථක ප්‍රායෝගික ප්‍රවේශයක් ලෙස සැලකේ. ජනතාවට සහ ප්‍රජාවන්ට විශ්වාසදායක අන්තර්ජාල ප්‍රවේශය ලබාදීම, අවශ්‍ය උපාංග සහ ඩිජිටල් කුසලතාව සමඟින් අවශ්‍ය ඩිජිටල් සේවාවන් සඳහා සම්බන්ධතාව සැපයීම රටක ජාතික සංවර්ධනය, මහජන ආරක්ෂාව, ආර්ථික ස්ථාවරභාවය සහ සමාජ සුබ සාධනය සඳහා අත්‍යවශ්‍ය වේ.

මෙම සුවිශේෂී අවස්ථාවේදී, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සමඟ පවත්වා ගෙන යන නොබිඳෙන හවුල්කාරිත්වය මෙන්ම ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනයේ 2026 වසරේ තේමාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන අපගේ කැප වීම මම යළි තහවුරු කරමි. අපගේ ජනතාවගේ ප්‍රයෝජනය උදෙසා ස්ථාවර, ආරක්ෂිත සහ සියලු ප්‍රජාවන්ට ඩිජිටල් සේවා වෙත ප්‍රවේශය සැලසෙන ඩිජිටල් වැඩ පිළිවෙළ තවදුරටත් ඉදිරියට ගෙන යාමෙහිලා අපි අඛණ්ඩව කැප වී සිටිමු.

අග්‍රාමාත්‍යතුමියගේ පණිවුඩය

ආචාර්ය හරිනි අමරසූරිය
අග්‍රාමාත්‍ය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

මැයි මස 17 වන දිනට යෙදී ඇති ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය (WTISD) නිමිත්තෙන් සුබ පැතුම් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳ මම සතුටු වෙමි.

"ඩිජිටල් සම්බන්ධතා ඔස්සේ බැඳුණු ජාලගත ලෝකයක ස්ථාවරත්වය ශක්තිමත් කිරීම" යන්න මෙවර තේමාව බවට ප්‍රකාශයට පත්කර ඇත. මෙම තේමාව මඟින් නූතන ජීවිතයේ වැඩි වශයෙන් රඳා පවතින අත්‍යවශ්‍ය සේවා සහ සන්නිවේදනය සඳහා සහය වන ශක්තිමත් හා විශ්වාසදායක ඩිජිටල් යටිතල පහසුකම්වල වැදගත්කම අවධානයට ලක් කරයි.

"පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් අපේක්ෂිත ප්‍රධානතම ඉලක්කයන් වන්නේ ඩිජිටල් තාක්ෂණය හුදෙක් සන්නිවේදන මෙවලමක් පමණක් නොව දූෂණයෙන් තොර කාර්යක්ෂම රාජ්‍ය පාලනයක් සහ ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැගීමේ ප්‍රධාන ප්‍රවාහයක් බවට පත්කිරීමයි.

රට පුරා පාසල්වල ෆයිබර් ඔප්ටික් අන්තර්ජාල ප්‍රවේශය සහ ඩිජිටල් ඉගෙනුම් පහසුකම් සක්‍රීය කිරීම මඟින් සියළුම පාසල්වලට සම අවස්ථා ලබාදීමේ අරමුණින් රජයේ පාසැල් තන්තුකරණ ව්‍යාපෘතිය වැදගත් පියවරක් ලෙස හැඳින්විය හැකිය.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ අදාළ පාර්ශවකරුවන්ගේ සහයෝගය මත ඩිජිටල් යටිතල පහසුකම් සහ සේවාවන්වල ස්ථායිතාව පවත්වාගෙන යමින් ජාතික ප්‍රගතියට අර්ථවත් දායකත්වයක් ලබාදිය හැකි පරිදි, ශ්‍රී ලංකාවේ ඩිජිටල් සංවර්ධනය අඛණ්ඩව ඉදිරියට යා යුතුව ඇත.

ඒ සඳහා අවශ්‍ය ශක්තිය හා ධෛර්යය මෙම ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනයේදී මම ප්‍රාර්ථනා කරමි.

ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය

ඉංජිනේරු එරංග වීරරත්න
නියෝජ්‍ය අමාත්‍ය
ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

2026 වසරේ ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය (WTISD) සමරන මේ මොහොතේ, "ඩිජිටල් සම්බන්ධතා ඔස්සේ බැඳුණු ජාලගත ලෝකයක ස්ථාවරත්වය ශක්තිමත් කිරීම" යන මෙම වසරේ තේමාවේ වැදගත්කම අවධාරණය කිරීමට ලැබීම පිළිබඳ මම සතුටු වෙමි. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේදී, ඩිජිටල් පරතරය අවම කිරීමත්, තාක්ෂණයෙන් ලැබෙන සමාජීය හා ආර්ථික ප්‍රතිලාභවලින් අවදානම් කණ්ඩායම් බැහැර නොවීම සහතික කිරීමත් සඳහා පුළුල් හා ඉලක්කගත ප්‍රයත්න ක්‍රියාත්මක කරමින්, මෙම මූලධර්මය අපගේ කාර්යයන්ට අන්තර්ගත කරඇත.

2026 ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය (WTISD) නවීන සමාජය රඳා පවතින අත්‍යවශ්‍ය සේවා සහ පද්ධති සඳහා සහය වන ස්ථායීතාවයෙන් යුතු ඩිජිටල් යටිතල පහසුකම්වල වැදගත්කම පෙන්වා දෙයි. විශ්වාසදායක අන්තර්ජාල ප්‍රවේශය, අවශ්‍ය උපාංග සහ ඩිජිටල් කුසලතාවය සමඟින් ජනතාවට සහ ප්‍රජාවන්ට අවශ්‍ය ඩිජිටල් සේවාවන් සඳහා සම්බන්ධතාවය සැපයීම ආපදා අවස්ථාවලදී පෙර අනතුරු ඇඟවීම් ලබාදීමට, ආරක්ෂිත ප්‍රවේශයට සහාය වීමට, ගෝලීය දත්ත ප්‍රවේශය පවත්වා ගැනීමට, හදිසි සන්නිවේදනයන් සක්‍රීය කිරීමට සහ අවශ්‍යතා ඇති ප්‍රජාවන් වෙත සම්බන්ධතාව පුළුල් කිරීමට උපකාරී වේ. එබැවින්, මහජන යහපැවැත්ම ආරක්ෂා කිරීම, අත්‍යවශ්‍ය සේවා පවත්වා ගැනීම සහ අවදානම් අවස්ථාවලදී ආර්ථික ස්ථාවරතාවයට සහාය වීම සඳහා ඩිජිටල් යටිතල පහසුකම්වල ස්ථායීතාවය ඉතා වැදගත් වේ. මෙවර තේමාව මඟින් අවධාරණය කරනුයේ, ඩිජිටල් ස්ථායීතාව ජාත්‍යන්තර සහයෝගිතාව, ප්‍රමිතීන්, ධාරිතා වර්ධනය, නවෝත්පාදනය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) අඛණ්ඩ ප්‍රයත්නයන් මඟින් සහාය ලබන විවිධ පද්ධති එකට ක්‍රියා කිරීම මත රඳා පවතින බවයි.

2030 ජාතික ඩිජිටල් ආර්ථික උපායමාර්ගය යටතේ, ඩිජිටල් ලෙස සම්බන්ධිත සහ සියලු දෙනා ඇතුළත් වන ජාතියක් ගොඩනැගීමට ශ්‍රී ලංකාව දැඩිව කැපවී සිටී. ජාතික ඩිජිටල් අනන්‍යතාව , ජාතික දත්ත හුවමාරු පද්ධතිය සහ රජයේ ඩිජිටල් ගෙවීම් පද්ධතිය වැනි ප්‍රධාන වැඩසටහන් මඟින් රටේ ඩිජිටල් පොදු යටිතල පහසුකම් ඉදිරියට ගෙන යමින් වඩා කාර්යක්ෂම හා පහසුවෙන් ප්‍රවේශ විය හැකි ඩිජිටල් සේවා සඳහා සහාය ලබා දේ. එමෙන්ම, ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ සිදු කළ නව සංශෝධනය සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළව පසුකාලීනව පනවන ලද රෙගුලාසි මඟින්, වැඩි සම්බන්ධතාව, නව තාක්ෂණයන් සහ ඩිජිටල් නවෝත්පාදනය සඳහා නියාමන පරිසරය ශක්තිමත් කරඇත. 5G තාක්ෂණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතය, සහ 2025-2029 ජාතික සයිබර් ආරක්ෂණ උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය තුළින් ශ්‍රී ලංකාව ස්ථායීතාවයෙන් යුතු ඩිජිටල් පද්ධති ගොඩනැගීමට සහ ඩිජිටල් සේවා සුරක්ෂිත කිරීමට ශ්‍රී ලංකාව දක්වන කැපවීම තවදුරටත් පිළිබිඹු වේ.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ 161 වන සංවත්සරය සහ ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය සමරන මේ අවස්ථාවේ, අර්ථවත් විශ්වීය සම්බන්ධතාවයකට පාදක වන සහ සමාජ හා ජාතීන් හරහා ආරක්ෂිත, දැරිය හැකි සහ ඵලදායී ඩිජිටල් ප්‍රවේශය සක්‍රීය කරන ශක්තිමත් ඩිජිටල් යටිතල පහසුකම් ගොඩනැගීම සඳහා සාමූහික ක්‍රියාකාරිත්වය අත්‍යවශ්‍ය බව කාලෝචිත ලෙස සිහිපත් කරයි.

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ ලේකම් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ පණිවුඩය

වරුණ ශ්‍රී ධනපාල
ලේකම් - ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

2026 වසරේ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය (WTISD) නිමිත්තෙන් මාගේ උණුසුම් ශුභාශිංසන පිරිනමමි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) විසින් සිය 161 වැනි සංවත්සරය සනිටුහන් කරන 2026 ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දින තේමාව වශයෙන්, "ඩිජිටල් සම්බන්ධතා ඔස්සේ බැඳුණු ජාලගත ලෝකයක ස්ථාවරත්වය ශක්තිමත් කිරීම" ප්‍රකාශයට පත්කර ඇති අතර එමඟින්, මහජන සුබසාධනය හා ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කරමින්, බාධාකාරී තත්ත්වයන්ට ඔරොත්තු දිය හැකි හා ඒවාට අනුගත විය හැකි සහ ඉක්මනින් යථා තත්ත්වයට පත්වීමට හැකි ඩිජිටල් පද්ධති සංවර්ධනය කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.

ඩිජිටල් ජාලයන්හි ජාල ස්ථායීතාව අද වන විට අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව ඇත. වත්මන් යුගයේ දී, රටක ශක්තිය පිළිබිඹු වන්නේ එහි ඩිජිටල් ජාල කෙතරම් හොඳින් සැලසුම්කර, ආරක්ෂාකර, එමෙන්ම අර්බුදකාරී අවස්ථාවලට මුහුණ දීමට සූදානම්කර තිබේ ද යන්න මතය. හදිසි අවස්ථාවන්හි දී, ඩිජිටල් ජාලයන් අඛණ්ඩව ක්‍රියාත්මක වීම සහ ඉක්මනින් යථා තත්ත්වයට පත්වීම මඟින් එම පද්ධතිවල සැබෑ වටිනාකම විද්‍යමාන වේ.

එවැනි ජාල ස්ථායීතාවයක් සාක්ෂාත් කරගැනීම සඳහා විවිධ අංශ ඔස්සේ ගනු ලබන අඛණ්ඩ සහ තිරසාර ප්‍රයත්නයන් අවශ්‍ය වේ. විදුලි සංදේශ භෞතික යටිතල පහසුකම් ශක්තිමත් කිරීම, තාක්ෂණික ශක්‍යතාවන් වර්ධනය කිරීම සහ ජනතාව ඩිජිටල් දැනුම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවන්ගෙන් සවිබල ගැන්වීම මෙම ක්‍රියාවලියේ ප්‍රධාන මූලිකාංග ලෙස සැලකේ.

ජාතික ඩිජිටල් ආර්ථික උපාය මාර්ගයට අනුකූලව, 5G තාක්ෂණය ක්‍රියාත්මක කිරීම, විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිතය සහ ඩිජිටල් පොදු යටිතල පහසුකම් මූලපිරීම්වල ප්‍රගතිය මඟින් ශ්‍රී ලංකාව විසින් ඕනෑම තත්ත්වයක් යටතේ මහජනතාවට සේවය කළ හැකි විශ්වාසදායක සහ ප්‍රතිචාරශීලී ඩිජිටල් පද්ධති ගොඩනැගීම සඳහා ගන්නා උත්සාහය පෙන්නුම් කරන අතර ජාතික සංවර්ධනය සඳහා පදනමක් ලෙස ඩිජිටල් ජාල ශක්තිමත් කිරීම සඳහා අපගේ කැපවීම ද මෙම ප්‍රයත්නයන් තුළින් පිළිබිඹු වේ.

කෙසේ වෙතත්, එවැනි ජාල ස්ථායීතාවයක් රජයට පමණක් පවත්වා ගත නොහැක. ඒ සඳහා රජය, පෞද්ගලික අංශය සහ ප්‍රජාවන් අතර සමීප සහයෝගීතාවක් අවශ්‍ය වේ. ඩිජිටල් ජාල ශක්තිමත් කිරීමට සහ සියලුම මට්ටම්වල හදිසි අවස්ථා සඳහා පූර්වගාමී අඛණ්ඩ සහ ක්‍රියාකාරී සැලසුම් නිර්මාණය කිරීම, බෙදාගත් වගකීම් වලින් හෙබි සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම හවුල්කාරිත්වය අත්‍යවශ්‍ය වේ. ප්‍රවේශම් සහගත සැලසුම්කරණය, කාලෝචිත ක්‍රියාමාර්ග සහ සූක්ෂ්ම යථා තත්ත්වයට පත්වීම තුළින් අපට සියලු දෙනා සඳහා වඩා ආරක්ෂිත, ශක්තිමත් සහ වඩාත් ස්ථාවර අනාගතයක් ගොඩනැගිය හැක.

මෙම අවස්ථාව සනිටුහන් කරමින්, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) වෙත මගේ හෘදයාංගම ශුභාශිංසනය පළ කරන අතර ඉදිරි වසරවලදී ගෝලීය සම්බන්ධතාවය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධනය සහ ජාත්‍යන්තර සහයෝගිතාව අඛණ්ඩව සාර්ථකව ඉදිරියට ගෙන යාම සඳහා මගේ සුබ පැතුම් පිරිනමමි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

එයාර් වයිස් මාර්ෂල් බන්දුල හේරත්
(විශ්‍රාමික)
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) අනුග්‍රහය යටතේ 2026 වසරේ ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය (WTISD) සැමරීමට ශ්‍රී ලංකාව ලෝකයේ සෙසු රටවල් සමඟ එක්වන අවස්ථාවේ මාගේ ශුභාශිංසන පළ කිරීමට ලැබීම පිළිබඳ මම සතුටු වෙමි. ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය යනු අන්තර්ජාලය හා අනෙකුත් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයන් මඟින් සමාජය සහ ආර්ථිකය තුළ උත්පාදනය කළ හැකි අවස්ථා සහ ප්‍රතිලාභ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා වූ වැදගත් අවස්ථාවකි. එමඟින් ඩිජිටල් පරතරය අවම කරමින් සමාජයේ සියලුම පිරිස් වලට සමාන අවස්ථා සැලසීමට මෙම තාක්ෂණයන් ලබා දෙන දායකත්වය පැහැදිලිව අවධාරණය කරයි.

මෙම වසරේ තේමාව "ඩිජිටල් සම්බන්ධතා ඔස්සේ බැඳුණු ජාලගත ලෝකයක ස්ථාවරත්වය ශක්තිමත් කිරීම" නූතන සමාජයේ ශක්තිමත් සහ විශ්වාසදායක ඩිජිටල් පද්ධති පිළිබඳ වර්ධනය වන වැදගත්කම කෙරෙහි අවධානය යොමු කරයි. විශ්වාසදායක අන්තර්ජාල ප්‍රවේශය, අවශ්‍ය උපාංග සහ ඩිජිටල් කුසලතාව සමඟින් ජනතාවට සහ ප්‍රජාවන්ට අවශ්‍ය ඩිජිටල් සේවාවන් සඳහා සම්බන්ධතාව සැපයීම තුළින් ජනතාවට සහය වීම, ආරක්ෂා කිරීම සහ සම්බන්ධතාවය පවත්වා ගැනීම මඟින් විශේෂයෙන්ම සිසුන්, රෝගීන්, වයෝවෘද්ධ පුද්ගලයන් වැනි ආන්තික කණ්ඩායම්වල සහ සමාජීය හෝ ආර්ථික අභියෝගයන්ට මුහුණ දෙන පිරිස්වල ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම උදෙසා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එමෙන්ම ස්වාභාවික ආපදා , මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා සහ අනෙකුත් අර්බුදකාරී අවස්ථාවලදී මෙම විශ්වාසදායක අන්තර්ජාල ප්‍රවේශය, අවශ්‍ය උපාංග සහ ඩිජිටල් කුසලතාව සමඟින් ජනතාවට සහ ප්‍රජාවන්ට අවශ්‍ය ඩිජිටල් සේවාවන් සඳහා සම්බන්ධතාව සැපයීමේ අවශ්‍යතාව වඩාත් වැදගත් වේ.

සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සේවා වැනි අත්‍යවශ්‍ය සේවාවන් වෙත ප්‍රවේශය සක්‍රීය කරමින්, විශ්වාසදායක අන්තර්ජාල ප්‍රවේශය, අවශ්‍ය උපාංග සහ ඩිජිටල් කුසලතාවය සමඟින් ජනතාවට සහ ප්‍රජාවන්ට අවශ්‍ය ඩිජිටල් සේවාවන් සඳහා සම්බන්ධතාව සැපයීම තුළින් සම්පත්, අවස්ථා සහ සමාජ සහභාගීත්වය සඳහා සාධාරණ ප්‍රවේශයක් සහතික කරන අතරම අභියෝගවලට අනුවර්තනය වීමේ පුද්ගලයන්ගේ හැකියාව වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරන මානව සහ ප්‍රජා සංවර්ධනය නිර්මාණය සඳහා වූ පරිපූර්ණ, තිරසාර ප්‍රවේශයකට දායක වේ. එය දෛනික ජීවිතයේදී වඩාත් ආරක්ෂිතව හා ස්වාධීනව ජීවත් වීමට ද උපකාරී වේ. මෙම විශ්වාසදායක අන්තර්ජාල ප්‍රවේශය, අවශ්‍ය උපාංග සහ ඩිජිටල් කුසලතාව සමඟින් ජනතාවට සහ ප්‍රජාවන්ට අවශ්‍ය ඩිජිටල් සේවාවන් සඳහා සම්බන්ධතාව සැපයීමේ කාර්යක්ෂමතාව දියුණු සන්නිවේදන තාක්ෂණයන්, වශයෙන් 4G සහ 5G ජාල මඟින් තවදුරටත් ශක්තිමත් කරනු ලබන අතර එමඟින් විශ්වාසදායක, අධිවේගී සහ අඩු ප්‍රමාදතාවකින් යුතු සම්බන්ධතාවක් ලබාදෙයි.

මෙම සන්දර්භය තුළ, 2026 වසරේ ශ්‍රී ලංකාවේ 5G තාක්ෂණය වාණිජමය වශයෙන් දියත් කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාවට වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකේ. මෙම සංවර්ධනය මඟින් සම්බන්ධතාව පුළුල් කිරීම, සේවා සැපයීම වැඩිදියුණු කිරීම සහ බහුවිධ අංශ හරහා නවෝත්පාදනයන් දිරිමත් කිරීම මඟින් විශ්වාසදායක අන්තර්ජාල ප්‍රවේශය, අවශ්‍ය උපාංග සහ ඩිජිටල් කුසලතාව සමඟින් ජනතාවට සහ ප්‍රජාවන්ට අවශ්‍ය ඩිජිටල් සේවාවන් සඳහා සම්බන්ධතාව සැපයීම තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින්, සියලුම දෙනා සඳහා සමාන අවස්ථා සලසන, ක්‍රියාකාරී සහභාගීත්වය සහිත අර්බුදකාරී අවස්ථා හමුවේ ඔරොන්තු දීමට, අනුවර්තනය වීමට සහ සමෘද්ධිමත් වීමට හැකි සමාජයක් නිර්මාණය කිරීම උදෙසා නව පරම්පරාවේ ඩිජිටල් යටිතල පහසුකම් භාවිතයට ගැනීමට ශ්‍රී ලංකාවට ප්‍රශස්ත අවස්ථාවක් හිමිව ඇත.

මෙම වැදගත් දිනය සමරන අවස්ථාවේ, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයට එහි ඉදිරි කටයුතු අඛණ්ඩව සාර්ථකව සිදු කිරීමට හැකියාව ලැබේවා යි. ප්‍රාර්ථනා කරන අතර 2026 වසරේ ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය සැමරීමට එක්වූ සියලුම දෙනාට මගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය

ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය (WTISD) 1969 වසරේ සිට සෑම වසරකම මැයි 17 දින සමරනු ලබයි. මෙම දිනයේ දී 1865 වසරේ පළමු ජාත්‍යන්තර ටෙලිග්‍රාෆ් සම්මුතිය අත්සන් කිරීම මෙන්ම ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) එක්සත් ජාතීන්ගේ ඩිජිටල් තාක්ෂණ නියෝජිතායතනය ස්ථාපනය කිරීම සිහිපත් කරයි.

සමාජීය හා ආර්ථික දියුණුව ඇති කිරීමෙහි ලා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) සිදුකරන වැදගත් කාර්යභාරය පිළිබඳ ගෝලීය දැනුවත්භාවය වැඩි දියුණු කිරීම ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනයේ මූලික අරමුණයි. එමෙන්ම ඩිජිටල් පරතරය අවම කිරීම සහ සියලු දෙනාටම ඩිජිටල් සම්පත් වෙත සාධාරණ හා සමාන ප්‍රවේශයක් සහතික කිරීමේ වැදගත්කම ද මෙහිදී අවධාරණය කරයි.

ඓතිහාසික පසුබිම

1865 මැයි 17 දින ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) පිහිටුවීමත්, පැරිසියේ පළමු ජාත්‍යන්තර ටෙලිග්‍රාෆ් සම්මුතිය අත්සන් කිරීමත් සනිටුහන් කරමින්, 1969 මැයි 17 දින ප්‍රථම වරට ලෝක විදුලි සංදේශ දිනය (WTD) අනුස්මරණය කරන ලදී. පසුව, 1973 දී ස්පාඤ්ඤයේ ටොරෙමොලිනෝස්හි පැවති ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ පූර්ණ බලැති ප්‍රතිපත්ති සම්පාදන සමුළුවේදී මෙම සැමරුම නිල වශයෙන් ස්ථාපිත කරනු ලැබිණි.

ඉන් අනතුරුව 2005 දී පැවති ලෝක තොරතුරු සමාජ සමුළුව (WSIS) මඟින් මැයි මස 17 දිනය “ලෝක තොරතුරු සමාජ දිනය” (WISD) ලෙස නම් කරන ලෙස එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට යෝජනා කරන ලදී. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) වර්ධනයේ වැදගත්කම අවධාරණය කිරීමත්, එහි සංවර්ධනය හා භාවිතය සමඟ සම්බන්ධ විවිධ සමාජීය හා ආර්ථික අභියෝග සඳහා විසඳුම් සොයා ගැනීමට අවධානය යොමු කිරීමත් මෙහි ප්‍රධාන අරමුණ විය.

ඒ අනුව 2006 මාර්තු මාසයේ දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මැයි මස 17 වැනි දිනය “ලෝක තොරතුරු සමාජ දිනය” ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. මින් පසුව එම වසරේම, තුර්කියේ ඇන්ටාලියාහි පැවති ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ පූර්ණ බලැති ප්‍රතිපත්ති සම්පාදන සමුළුවේදී, මේ දිනට අදාළ සැමරුම් දෙක එක්කළ යුතු බවට තීරණය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඒකාබද්ධ සැමරුමක් ලෙස සෑම වසරකම මැයි මස 17වැනි දිනය “ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය” (WTISD) ලෙස හැඳින්විණි.

ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය නූතන සමාජයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ (ICT) පරිවර්තනීය ශක්තිය අවධාරණය කරන වැදගත් වේදිකාවක් ලෙස ක්‍රියා කරයි. එහිදී සියලුම පුද්ගලයින්ට සහ ප්‍රජාවන්ට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයන් (ICT) වෙත ප්‍රවේශය ඇති බව සහ ඒවා භාවිතා කළ හැකි බව සහතික කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ග, ක්‍රියාකාරකම් සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවයට අවධානය යොමු කරන අතර, තාක්ෂණයට ප්‍රවේශ වීමේ පවතින විෂමතා අඩු කිරීමට ජාත්‍යන්තර මට්ටමින් සිදුකරන ප්‍රයත්නයන් ද ශක්තිමත් කරයි.

මෙහිදී සෑම වසරකම, ගෝලීය සැමරුම් පැවැත්වීම සඳහා විදුලි සංදේශ හා තොරතුරු සමාජයට අදාළ කාලීන ගැටළු පිළිබඳව අර්ථවත් සංවාදයක් ඇති කිරීම ප්‍රවර්ධනය කිරීමෙහි ලා විශේෂිත තේමාවක් තෝරා ගනු ලැබේ.

2026 ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනයේ තේමාව

2026 වසරේ ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය (WTISD) සඳහා තේමාව වන්නේ "ඩිජිටල් සම්බන්ධතා ඔස්සේ බැඳුණු ජාලගත ලෝකයක ස්ථාවරත්වය ශක්තිමත් කිරීම” යන්නයි. මෙම තේමාව නූතන ජීවිතයට අත්‍යවශ්‍ය වන ඩිජිටල් පද්ධති තවදුරටත් ශක්තිමත් කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. එමඟින් ලෝකය ක්‍රියාත්මක වීමට උපකාරී වන ඩිජිටල් ජාල සහ සේවාවන් වඩාත් ශක්තිමත් කරන රජයන්, කර්මාන්ත සහ ප්‍රජාවන්ගෙන් ඉල්ලා සිටින අතර එය ජීවිත සහ ජීවනෝපායන් සුරක්ෂිත කරමින්, බාධා හමුවේ අනුවර්තනය වීමට, ස්ථාවරත්වය පවත්වා ගැනීම සහ නැවත යථා තත්ත්වයට පැමිණීමට හැකි ඩිජිටල් පද්ධති ගොඩනැගීම සහතික කරයි.

සන්නිවේදන ජාල ස්ථාවරත්වය ශක්තිමත් කිරීම

වර්තමානයේ, ගෝලීය වශයෙන් ව්‍යාප්තවූ ඩිජිටල් අන්තර් සම්බන්ධිත සන්නිවේදන ජාලයන් මඟින් දෛනික ජීවිතයේ ආර්ථික ක්‍රියාකාරකම් සහ මහජන සේවා සඳහා අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. මෙම ජාල විශ්වාසනීය නොවූ විට හෝ අසාර්ථක වූ විට, එයින් ඇතිවන බලපෑම සමාජයේ විවිධ ක්ෂේත්‍රයන්ට පුළුල් හා බරපතළ ලෙස බලපෑම් කරනු ලබයි. ජාල අක්‍රීයතාවයක් මත ඇතිවන ක්ෂණික බලපෑම වන්නේ සම්බන්ධතාව මත පදනම් වූ කාර්යයන් ඉටු කිරීම අසීරු වීමෙන් පුද්ගලයන්ගේ ව්‍යාපාර සහ ආර්ථිකය මුළුමනින්ම අසමතුලිතතාවට පත්වීමයි. ඒ නිසා, විශේෂයෙන්ම හදිසි අවස්ථා හා ආපදා තත්ත්වයන්හිදී, අඛණ්ඩ හා ස්ථාවර ජාල ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම ඉතා වැදගත් කරුණක් ලෙස සැලකේ.

සන්නිවේදන ජාල ස්ථාවරත්වය මූලික මූලධර්ම දෙකක් මත ගොඩනැඟී ඇත. එනම් ජාල අතිරික්තතාව (Network Redundancy) සහ ජාල විවිධත්වය යි. ජාල අතිරික්තතාව (Network Redundancy) යනු සබ්මැරීන් කේබල්, භෞමික සම්ප්‍රේෂණ පද්ධති, චන්ද්‍රිකා සහ දත්ත මධ්‍යස්ථාන වැනි ප්‍රධාන සංරචක අසාර්ථක වූ විට ක්‍රියාත්මක වීමට හැකි උපස්ථ පද්ධති ඇති බව සහතික කිරීමයි. ජාල විවිධත්වය මඟින් විවිධ තාක්ෂණ, සැපයුම්කරුවන් සහ මාර්ග භාවිත කිරීමෙන් එකම දුර්වලතාවක් හේතුවෙන් සම්පූර්ණ පද්ධතියම අසාර්ථක වීමේ අවදානම අඩු කරයි. ඊට අමතරව, බල සැපයුම් පද්ධති, සන්නිවේදන කුළුණු සහ ප්‍රවේශ පහසුකම් වැනි භෞතික යටිතල පහසුකම් ශක්තිමත් කිරීම ද කඩිනමින් ජාල යථා තත්ත්වයට පත්වීම සඳහා ඉතා වැදගත් වේ. ක්ලවුඩ පරිගණකකරණය (cloud computing), අථත්‍යකරණය (virtualization) සහ කෘත්‍රිම බුද්ධිය (AI) වැනි නව තාක්ෂණයන් භාවිතයෙන් ජාලයන්ගේ නම්‍යශීලීභාවය සහ ජාල ස්ථාවරත්වය තවදුරටත් වර්ධනය වේ. මෘදුකාංග-නිර්වචිත ජාලකරණය (software-defined networking -SDN), කෘත්‍රිම බුද්ධිය (AI) සහ යන්ත්‍ර ඉගෙනුම් (Machine Learning) තාක්ෂණයන් සමඟ එක්ව ක්‍රියා කිරීමෙන්, ගැටළු කලින් හඳුනා ගැනීමටත්, බාධා ඇතිවන අවස්ථාවලදී ජාල ස්වයංක්‍රීයව වෙනස්වීම් වලට අනුව අනුවර්තනය වීමටත් සහාය වේ. තාක්ෂණික විසඳුම් වලට අමතරව, ක්‍රියාකරුවන්, නියාමකයින් සහ අනෙකුත් අදාළ පාර්ශව අතර ඵලදායී සහයෝගිතාවය ද ඉතා වැදගත් වේ. විශේෂයෙන්ම තීරණාත්මක අංශවලට බලපෑම් ඇතිවන අවස්ථාවලදී, බාධා වලට ඉක්මන් ප්‍රතිචාර ලබාදීමට එය උපකාරී වේ.

ජාල ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා පවතින අභියෝග

ජාල ස්ථාවරත්වය පවත්වාගෙන යාමට අහිතකර ලෙස බලපාන විවිධ අභියෝගවලට සන්නිවේදන ජාලයන් මුහුණ දෙයි. විශේෂයෙන්ම ආන්තික කාලගුණික තත්ත්වයන් ඇතුළු ස්වාභාවික ආපදා වැනි විශ්වාසනීය සන්නිවේදනය වඩාත් අවශ්‍ය වන අවස්ථාවලදී ජාල යටිතල පහසුකම් වලට දැඩි හානි සිදු විය හැකිය. සුළි සුළං, ගංවතුර හා ලැව්ගිනි වැනි සිදුවීම් පවතින අවස්ථාවලදී ජාල පද්ධතිවල ඇතිවන දුර්වලතා පිළිබඳ අවධානය යොමුකර, ඒවා තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව මතුවේ. එමෙන්ම විදුලිබල බිඳවැටීම් ද ජාල බාධා ඇතිවීමට ප්‍රධාන හේතුවක් වන අතර එය දෘඩාංග හා මෘදුකාංග ක්‍රියාකාරිත්වයට එකසේ බලපායි

අවසන් පරිශීලකයන්ට ආසන්න ප්‍රවේශ ජාල සාමාන්‍යයෙන් අඩු ස්ථායීතාවයක් දක්වයි. ඊට අමතරව සම්ප්‍රේෂණ සම්බන්ධතා, ස්විචිකරණ සම්බන්ධතා සහ අන්තර්ජාල හුවමාරු ස්ථාන වැනි ප්‍රධාන යටිතල පහසුකම් කොටස් විශේෂයෙන්ම ඉතා වැදගත් වේ.

ආන්තික කාලගුණික තත්ත්වයන් ඇතුළු ස්වාභාවික ආපදා වැනි විශ්වාසනීය සන්නිවේදනය වඩාත් අවශ්‍ය වන අවස්ථාවලදී ජාල යටිතල පහසුකම් වලට දැඩි හානි සිදු විය හැකිය. සුළි සුළං, ගංවතුර හා ලැව්ගිනි වැනි සිදුවීම් පවතින අවස්ථාවලදී ජාල පද්ධතිවල ඇතිවන දුර්වලතා පිළිබඳ අවධානය යොමුකර, ඒවා තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව මතුවේ. එමෙන්ම විදුලිබල බිඳවැටීම් ද ජාල බාධා ඇතිවීමට ප්‍රධාන හේතුවක් වන අතර එය දෘඩාංග හා මෘදුකාංග ක්‍රියාකාරිත්වයට එකසේ බලපායි

ක්‍රියාකාරිත්වයට එකසේ බලපායි. ජංගම ජාල, ස්ථාවර ජාලයන්ට සාපේක්ෂව එවැනි බාධා වලට වැඩි වශයෙන් ගොදුරු විය හැකි අතර මූලික ජාල සංරචකයන්ට වඩා ඒවා අසාර්ථක වුවහොත් සන්නිවේදන සේවා සුවිශාල වශයෙන් බිඳ වැටීමට හේතු විය හැකි අතර එය සමස්ත ජාල ක්‍රියාකාරිත්වයට ද බරපතළ බලපෑම් ඇති කරයි.

සබ්මැරීන් කේබල් ගෝලීය සන්නිවේදනයේ මූලික අංගයක් වන අතර ජාත්‍යන්තර දත්ත සම්ප්‍රේෂණය බොහෝවිට ඒවා හරහා සිදු වේ. මෙම කේබල් වලට සිදුවන බොහෝ හානි ධීවර කටයුතු හෝ නැව් නැංගුරම් ඇදීම වැනි මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන අතර භූමිකම්පා, සුනාමි සහ දිය යට ධාරා වැනි ස්වාභාවික සිදුවීම් ඉතා කලාතුරකින් ඒ සඳහා හේතු වේ. ඊට අමතරව, මෙම පද්ධති ගොඩබිම් ජාල සමඟ සම්බන්ධ වන කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථාන ද විශේෂ අවදානමකට ලක්විය හැකි ස්ථාන ලෙස සැලකේ.

ජාල ස්ථාවරත්වය වැඩිදියුණු කිරීම සඳහා භාවිත කරන ඉංජිනේරු ක්‍රමවේද සහ ප්‍රවේශයන්

ජාල ස්ථාවරත්වය වැඩිදියුණු කිරීම සඳහා, ජාල ව්‍යූහය සහ ජාල ක්‍රියාකාරිත්වය යන දෙකම ශක්තිමත් කරන සැලසුම් ක්‍රම භාවිත කරයි. විකල්ප මාර්ග සහ අතිරේක සම්පත් සැපයීම සහතික කිරීම සඳහා ජාල අතිරික්තතාව සහ ජාල විවිධත්වය විවිධ ස්ථරයන් ඔස්සේ ක්‍රියාත්මක වේ. එසේම, ජාල බණ්ඩනය වැදගත් උපාය මාර්ගයක් වන අතර විශාල ජාල කුඩා කොටස්වලට බෙදීමෙන් දෝෂ අවමකර ඒවා ව්‍යාප්තිය වළක්වයි. ඇතැම් අවස්ථාවලදී, සාමාන්‍ය ක්‍රියාකාරිත්වයට බාධා ඇති වූ විට ජාලයේ කොටස් ස්වාධීනව ක්‍රියාත්මක වීමට හැකි ලෙස සැලසුම්කර ඇති අතර අනතුරුව ජාල පද්ධතිය යථා තත්ත්වයට පත් කරයි. ඊට අමතරව, සබ්මැරීන් කේබල් මාර්ග පුළුල් කිරීම සහ චන්ද්‍රිකා ජාල ඒකාබද්ධ කිරීම මඟින් ජාල ආවරණය වැඩිදියුණුකර, හදිසි අවස්ථාවලදී විශ්වාසනීය උපස්ථ සම්බන්ධතාවයක් (Backup connectivity) ලබාදීමට ද හැකිවේ.

මෙහෙයුම් ස්ථායීතාව ශක්තිමත් කිරීම සඳහා, නවීන ජාල කළමනාකරණ පද්ධති මඟින් ස්වයංක්‍රියකරණය භාවිත කරමින් අධීක්ෂණය, විෂමතා හඳුනාගැනීම සහ ප්‍රතිසාධන ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සිදු කරයි. මෙම ශක්‍යතාවන් ජාලයේ විවිධ ස්ථර හරහා සේවා අඛණ්ඩතාව පවත්වා ගැනීමට ඉතා වැදගත් වේ. ඊට අමතරව, සන්නිවේදන ජාල අනෙකුත් යටිතල පහසුකම්, විශේෂයෙන්ම විදුලිබල පද්ධති මත දැඩි ලෙස රඳා පවතී. එබැවින් විදුලිය ඇනහිටීම් ජාල බාධා ඇතිවීමට ප්‍රධාන හේතුවක් වන අතර ඒ නිසාම විදුලි සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා විශේෂයෙන්ම ජංගම පාදක ස්ථාන සඳහා උපස්ථ ජනක යන්ත්‍ර, බැටරි පද්ධති සහ විවිධ බලශක්ති ප්‍රභව භාවිතය වැනි ක්‍රම බහුලව යොදා ගනී. තවද, සූර්ය හා සුළං වැනි පුනර්ජනනීය බලශක්ති විසඳුම් ද විකල්ප ලෙස භාවිත කළ හැකි නමුත් ඒවා පාරිසරික තත්ත්වයන් මත යම් සීමා ඇතිව ක්‍රියා කරයි. ආපදා අවස්ථාවලදී, අතේ ගෙන යා හැකි බලශක්ති විසඳුම් ආපදාවෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල ප්‍රතිසාධන කටයුතු වේගවත් කිරීමේ ප්‍රයත්නයන්ට ද උපකාරී වේ.

කුළුණු, ගොඩනැගිලි සහ ජංගම දුරකථන සන්නිවේදන මධ්‍යස්ථාන වැනි යටිතල පහසුකම්වල භෞතික ශක්තිමත්භාවය ප්‍රධාන වැදගත් කරුණකි. සුදුසු ස්ථාන තෝරා ගැනීම, නායයෑම් වැනි පාරිසරික අවදානම් සඳහා පසේ සංවේදීතාව තක්සේරු කිරීම, ව්‍යුහාත්මක ස්ථායීතාව විශ්ලේෂණය කිරීම සහ අවශ්‍ය ශක්තිමත් කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම මඟින් මෙම වත්කම් ස්වාභාවික ආපදා වලට වඩාත් ඔලදායී ලෙස ඔරොත්තු දිය හැකි බව සහතික කිරීමට දායක වේ. එමෙන්ම, ආපදා අවස්ථාවලදී හානියට පත් ප්‍රවාහන පද්ධති අලුත්වැඩියා කිරීමට කාලය ගත විය හැකි බැවින්, ප්‍රතිසාධන කටයුතු සඳහා මෙම ස්ථාන වෙත ඉක්මන් ප්‍රවේශය ලබා දීම ද අත්‍යවශ්‍ය වේ. මේ සඳහා සන්නද්ධ හමුදා හා හදිසි සේවාවල නිරත රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. ඊට අමතරව, තීරණාත්මක ස්ථාන ආසන්නයේ සුදුසුකම් ලත් පුද්ගලයින් හා සම්පත් ස්ථානගත කිරීම වැනි පූර්ව සැලසුම්ගත ක්‍රියාමාර්ග මඟින් ආපදා අවස්ථාවල ප්‍රතිචාර කාලය අඩුකර ගනිමින් කාර්යක්ෂමතාව වැඩිදියුණු කළ හැකිය.

තාක්ෂණික විසඳුම් වලට අමතරව, ජාල ස්ථාවරත්වය වැඩි දියුණු කිරීම සඳහා ආයතනික උපායමාර්ග ඉතා වැදගත් වේ. සේවා සපයන්නන්, නියාමන ආයතන සහ අනෙකුත් සම්බන්ධ පාර්ශ්ව අතර ඇති සහයෝගිතාවය, බාධාකාරී තත්වයන්ට ඉක්මන් හා සම්බන්ධීකරණ ප්‍රතිචාර ලබාදීමට උපකාරී වේ. විශේෂයෙන්ම බලශක්ති, ප්‍රවාහන සහ සන්නිවේදන වැනි යටිතල පහසුකම් කිහිපයක් කෙරෙහි එකවර බලපාන මහා පරිමාණ අර්බුදවලදී, බහු-අංශ සම්බන්ධතා ඉතාමත් අත්‍යවශ්‍ය වේ.මෙහිදී වැදගත් ක්‍රියාමාර්ග ලෙස, නිතර හදිසි තත්ත්ව අභ්‍යාස සිදු කිරීම, පැහැදිලි සන්නිවේදන ක්‍රමවේද සැකසීම, භූමිකා හා වගකීම් නිශ්චිතව බෙදාහැරීම, සහ කාර්ය මණ්ඩලය අර්බුද කළමනාකරණය සඳහා සුදුසු ලෙස පුහුණු කිරීම සඳහන් කළ හැක.මෙවැනි ක්‍රියාමාර්ග මඟින් සූදානම ඉහළ දමමින්, ප්‍රතිචාරයේ කාර්යක්ෂමතාව වැඩි කර, කාර්ය මණ්ඩල ආරක්ෂාව තහවුරු කරමින්, සේවා ඉක්මනින් යථා තත්ත්වයට පත් කිරීමටද සහාය ලැබේ.

සමස්තයක් වශයෙන්, ස්ථාවර සන්නිවේදන ජාල ගොඩනැගීම සඳහා තාක්ෂණික විසඳුම් සහ ආයතනික සූදානමේ එකතුවක් අවශ්‍ය වේ. ශක්තිමත් යටිතල පහසුකම් සැලසුම් කිරීම, නවීන තාක්ෂණයන් භාවිත කිරීම සහ කාර්යක්ෂම සහයෝගිතා පද්ධති එක්කරගැනීම මඟින්, ජාල බාධා වලට වඩා හොඳින් මුහුණ දීමටත් ඉක්මනින් යථා තත්ත්වයට පත් කිරීමටත් හැකිවේ. එමඟින් අත්‍යවශ්‍ය සේවාවන් අඛණ්ඩව සහ විශ්වාසනීය ලෙස පවත්වාගෙන යාම සහතික වේ.

‘ගමට සන්නිවේදනය’ සහ ‘පාසල් ෆයිබර්කරණ’ ව්‍යාපෘති මඟින් ඩිජිටල් සේවා ව්‍යාප්ති පරතරය අවම කිරීම

අද දින සමස්ථ ලෝකවාසීන් ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය (WTISD) සමරන මෙම අවස්ථාවේ, ගෝලීය අවධානය යොමු වී ඇත්තේ “ඩිජිටල් සම්බන්ධතා ඔස්සේ බැඳුණු ජාලගත ලෝකයක ස්ථාවරත්වය ශක්තිමත් කිරීම” යන තේමාව වෙතයි. ජාත්‍යන්තර වශයෙන් සබ්මැරීන් කේබල් සහ චන්ද්‍රිකා ජාල වැනි විශාල පද්ධති ගැන කතා කළද, ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාවට “ඩිජිටල් සම්බන්ධතා” යන්න වඩාත් අර්ථවත් වන්නේ දෛනික ජීවිතයට සෘජුව බලපාන ප්‍රයෝජනවත් සම්බන්ධතාවක් වශයෙනි. එය දුරස්ථ ගමක සිටින ශිෂ්‍යයෙකුට ඩිජිටල් පුස්තකාල භාවිත කිරීමට, ගොවියෙකුට වෙළඳපොළ මිල පිළිබඳ තොරතුරු සොයා බැලීමට, මෙන්ම කුඩා ව්‍යාපාරයකට ජාත්‍යන්තර වෙළඳපොළ සමඟ සම්බන්ධ වීමට හැකිවන අවස්ථාවක් ලෙස ප්‍රකාශ වේ. එහෙත්, මෙවැනි සම්බන්ධතා යථාර්ථයක් වීමට ශක්තිමත් භෞතික පදනමක් අත්‍යවශ්‍ය වේ. එම අරමුණ ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන “ගමට සන්නිවේදනය” සහ “පාසල් ෆයිබර්කරණ” වැනි ප්‍රධාන ව්‍යාපෘති, මඟින් ඩිජිටල් සම්බන්ධතා සහ සේවා සැපයීමේ අසමතුලිතතා අවම කරමින්, ශ්‍රී ලංකාවේ කිසිදු ගමක් හෝ පාසලක් තොරතුරු තාක්ෂණයෙන් බැහැර නොවන බව සනාථ කරමින් රටේ සන්නිවේදන පද්ධතිය නව දිශාවකට ගෙන යමින් පවතී.

‘ගමට සන්නිවේදනය’ ව්‍යාපෘතිය (GSP)

මෙම පරිවර්තන ක්‍රියාවලියේ ප්‍රධාන වැඩසටහනක් වන “ගමට සන්නිවේදනය” ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් ක්‍රියාත්මක කරන ජාතික වැඩසටහනක් වන අතර, එම ව්‍යාපෘතිය මඟින් 2029 වසර අවසන් වන විට ආසන්න වශයෙන් කුළුණු 600 ක් සම්පූර්ණ කිරීමෙන් 100% දිවයින පුරා 4G ෆයිබර් ආවරණය පිළිබඳ දැක්ම වේගයෙන් යථාර්ථයක් බවට පත් කිරීමට අපේක්ෂා කරයි. 2026 වසරේ එනම් මෙවර තේමාවෙන් අවධාරණය කරන්නේ ඩිජිටල් සම්බන්ධතාව තවදුරටත් සුබෝපභෝගී කරුණක් නොව, සමාජ හා ආර්ථික ස්ථායීතාවයට අත්‍යවශ්‍ය පදනමක් බවයි. මෙම ව්‍යාපෘතිය, ජාතික ජාලයේ සේවා ආවරණය අඩු හෝ නොමැති ප්‍රදේශ හඳුනාගෙන, එම ප්‍රදේශ සඳහා සම්බන්ධතාවය සැපයීමෙහිලා ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික්ක 25ක් සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 14,000ක් ආවරණය කරමින්, මහජන පැමිණිලි ප්‍රමුඛ කරගත් සවිස්තරාත්මක සමීක්ෂණයක් අනුව, සාම්ප්‍රදායික වෙළඳපොළ ක්‍රියාමාර්ගයන් තුළ මීට පෙර ළඟා නොවූ ඌන සේවා ප්‍රදේශ ඉලක්ක කරගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඇත.

පෙර සේවා පහසුකම් නොලැබුණු ප්‍රදේශවලට ක්ෂණික සේවා සපයමින්, කුළුණු 85ක් සාර්ථකව නිම කිරීමත් සමඟ මෙම ව්‍යාපෘතිය එහි සම්පූර්ණ සම්බන්ධතා ඉලක්ක සාක්ෂාත් කරගැනීම කරා අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. ගෝලීය ආර්ථික අභියෝග සහ මෙහෙයුම් වියදම් ඉහළ යමින් තිබුණ ද, රජය කුළුණු ඉදිකිරීම් වේගවත් කිරීම සඳහා සංශෝධිත මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. මෙම වසර තුළ පමණක් නව විදුලි සංදේශ කුළුණු 150කට අධික සංඛ්‍යාවක් ස්ථාපනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය මඟින්, දුරස්ථ ප්‍රජාවන්ට ද සමානව සේවා සම්බන්ධතා සැපයීම සහතික කරයි.

“පාසල් ෆයිබර්කරණ” ව්‍යාපෘතිය: ඊළඟ පරම්පරාව සවිබල ගැන්වීම

ග්‍රාමීය ප්‍රදේශවලට අන්තර්ජාලය ලබාදීම පමණක් ප්‍රමාණවත් නොවේ. සැබෑ සංවර්ධනය ඇතිවන්නේ එය අධ්‍යාපනයට එක්කර, දරුවන්ට දැනුම, කුසලතා සහ ගෝලීය අවස්ථා ලබාදෙන විටය; පන්ති කාමරය තුළ ඇති සම්බන්ධතාවය අනාගතය ගොඩනැගීමේ මූලික පදනම වේ. “පාසල් ෆයිබර්කරණ” ව්‍යාපෘතිය මඟින් දිවයින පුරා ද්විතීයික පාසල් 6,000ක් පමණ සඳහා වේගවත් සහ විශ්වාසදායක අන්තර්ජාල පහසුකම් ලබාදීමට සැලසුම්කර ඇත.මෙම වැඩසටහන ඩිජිටල් ඉගෙනීම වැඩිදියුණු කිරීම, පාසල් පරිපාලන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ නවීන අධ්‍යාපනික තාක්ෂණික මෙවලම් භාවිතයට සහාය වීම සඳහා ක්‍රියාත්මක වේ.

අද වන විට, ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) සමාගම විසින් පාසල් 1,314 ක් ෆයිබර් ඔප්ටික් යටිතල පහසුකම් මඟින් සාර්ථකව සම්බන්ධකර ඇති අතර තවත් පාසල් 607ක් ක්‍රියාත්මක කිරීමේ අදියරේ සිට කඩිනමින් අවසන් කිරීමට නියමිතව පවතී. මෙම ව්‍යාපෘතිය පුළුල් කිරීමේ ඊළඟ අදියර දැනටමත් හඳුනාගෙන ඇති අතර, ඒ අනුව ෆයිබර්කරණය සඳහා අමතර පාසල් 1,495 ක් ඉලක්ක කර ගෙන ඇත. මෙම වැඩසටහන හුදෙක් අන්තර්ජාල පහසුකම් සැපයීම පමණක් නොව, අධ්‍යාපන පද්ධතිය නවීකරණය කිරීම, ඩිජිටල් ඉගෙනුම් මෙවලම් භාවිතයට සහාය වීම සහ රට පුරා පරිපාලන කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහාද වැදගත් දායකත්වයක් සපයයි.

අපි 2026 වසරේ ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය (WTISD) සමරන මෙම අවස්ථාවේ, ශ්‍රී ලංකාව ඉතා වැදගත් සංධිස්ථානයක පසුවේ. “ගමට සන්නිවේදනය” සහ පාසල් ෆයිබර්කරණ ව්‍යාපෘතිය වානේ ව්‍යූහ, දෘඩාංග හෝ කේබල් ඉදිකිරීමට පමණක් නොව, ඩිජිටල් ආර්ථිකයකට අවශ්‍ය මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ප්‍රයත්නයක් වන අතර, එය ශ්‍රී ලංකාවේ ජාල ස්ථාවරත්වයට ද වැදගත් දායකත්වයක් සපයයි. එය ඩිජිටල් පරිවර්තනය පිළිබඳ අපගේ ජාතික ඉලක්ක සමඟ සමගාමීව පුරවැසියන්ට වැඩි වැඩියෙන් ඩිජිටල් ලෝකයට අනුව හැඩගැසීමට අවශ්‍ය මෙවලම් ලබාදෙයි. ස්ථාවර ජාලගත ලෝකයක කිසිදු ගමක් හුදකලා විය යුතු නොවේ. මෙම ව්‍යාපෘති මඟින් ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක්ම ගෝලීය ජාලයට සම්බන්ධ කර, ශක්තිමත්, ආරක්ෂිත සහ සියලු දෙනාට ප්‍රවේශ විය හැකි ඩිජිටල් සම්බන්ධතාවයක් ගොඩනැගීම අපි සහතික කරමු.

දියුණු ඩිජිටල් ආර්ථිකයක් කරා මූලික සම්බන්ධතාවයෙන් ඔබ්බට : ස්ථායී ඩිජිටල් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් එයාර් වයිස් මාර්ෂල්
බන්දුල හේරත් (විශ්‍රාමික)

මැයි 17 දින ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය සමරනු ලබන්නේ 1865 වසරේ දී ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය ස්ථාපනය කළ දිනය සිහිපත් කරමිනි. විදුලි සංදේශනය මෝර්ස් කේත පණිවිඩවල සිට අද වන විට කෘත්‍රිම බුද්ධියෙන් බලගැන්වෙන ජාල සහ ක්ෂණික වීඩියෝ සන්නිවේදනය දක්වා දියුණු වී ඇති අතර අද මිනිසුන්ගේ සම්බන්ධතා, අධ්‍යාපනය, ව්‍යාපාර සහ දෛනික ජීවිතය පවත්වාගෙන යාමේ මූලික පදනමක් බවට පත්ව ඇත. කලක් රජයන් සහ හමුදා ක්ෂේත්‍රයන්ට පමණක් සීමා වී තිබූ මෙම තාක්ෂණය, අද වන විට සමාජයේ අත්‍යවශ්‍ය නමුත් බොහෝ විට අපගේ අවධානයට ලක් නොවන මූලික යටිතල පහසුකමක් ලෙස පරිණාමය වී ඇත.

"ඩිජිටල් සම්බන්ධතා ඔස්සේ බැඳුණු ජාලගත ලෝකයක ස්ථාවරත්වය ශක්තිමත් කිරීම" යන මෙවර ගෝලීය තේමාව, ආර්ථික අභියෝග රැසකට මුහුණ දීමෙන් අනතුරුව නැවත නැඟී සිටීමට, නවීන තාක්ෂණය වැළඳ ගැනීමට සහ ඩිජිටල් ශක්‍යතාවන් වර්ධනය කිරීමට උත්සාහ කරන ශ්‍රී ලංකාවට විශේෂ වැදගත්කමක් ලබා දෙයි. මෙම පරිවර්තනීය ගමනේ ප්‍රමුඛ භූමිකාව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) අධ්‍යක්ෂ ජනරාල් එයාර් වයිස් මාර්ෂල් බන්දුල හේරත් (විශ්‍රාමික) මහතා විසින් ඉටු කරන අතර, ඔහුගේ ධූර කාලය වේගවත් නවීකරණ වැඩපිළිවෙළ, පුළුල් සංවර්ධන ව්‍යාපෘති සහ දූෂණයට එරෙහි දැඩි ක්‍රියාමාර්ග හේතුවෙන් විශේෂ අවධානයට ලක්ව ඇත.

ඔහුගේ අදහස අනුව, විදුලි සංදේශනය යනු දුරකථන සේවා හෝ අන්තර්ජාල පහසුකම්වලට පමණක් සීමා වූ ක්ෂේත්‍රයක් නොවේ. "සන්නිවේදනය අද ලෝකය එකට බැඳ තබන ප්‍රධාන පදනමක්," යැයි ඔහු ප්‍රකාශ කළේය. එය නොමැතිව රටක් ජාත්‍යන්තර ප්‍රජාවෙන් මෙන්ම තම ජනතාවගෙන් පවා හුදකලා වේ.

■අදෘශ්‍යමාන ජාතික සම්පත

රූපවාහිනී විකාශන, ජංගම දුරකථන සන්නිවේදන, Wi-Fi ජාල, චන්ද්‍රිකා සම්ප්‍රේෂණ සහ හදිසි සන්නිවේදන සේවා පවත්වාගෙන යන ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳව සාමාන්‍ය ජනතාව වැඩි අවධානයක් නොදක්වයි. එහෙත් බන්දුල හේරත් මහතා පවසන්නේ එය රටේ අතිශය වටිනා ජාතික සම්පතක් බවයි. "ජලය හා භූමිය මෙන්ම ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය ද ජනතාවට අයත් ජාතික වත්කමක්," යැයි ඔහු සඳහන් කළේය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් විදුලි සංදේශ, විකාශනය, ප්‍රවාහනය හා නාවික කටයුතු, හදිසි සේවා, විද්‍යාත්මක යෙදුම් සහ කාර්මික මෙහෙයුම් ඇතුළු ප්‍රධාන අංශ හයක් අතර මෙම සීමිත සංඛ්‍යාත වර්ණාවලි සම්පත නිසි හා කාර්යක්ෂම ලෙස වෙන් කිරීම සහ එහි ආරක්ෂාව තහවුරු කිරීම අධීක්ෂණය කරයි.

සාමාන්‍ය පුරවැසියකු සංඛ්‍යාත වර්ණාවලිය භාවිතයට ගනු ලබන්නේ ස්මාර්ට් දුරකථන, Wi-Fi හෝ රූපවාහිනී දුරස්ථ පාලක වැනි දෛනික උපකරණ හරහා වුවද, එහි සැබෑ භූමිකාව ඊට වඩා විශාලය. ගුවන් යානා මෙහෙයවීම, සමුද්‍රීය සන්නිවේදනය, ආපදා අනතුරු ඇඟවීම්, කාලගුණ අනාවැකි පද්ධති සහ හදිසි සේවා ක්‍රියාත්මක වීම සඳහා ද සංඛ්‍යාත වර්ණාවලිය අත්‍යවශ්‍ය වේ. අද පවතින අධි-සම්බන්ධිත ලෝකයේ, සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය ආර්ථික ප්‍රගතියට පමණක් නොව ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා ද මූලික වැදගත්කමක් ගෙන ඇත.

■නූතන යුගයට අනුව විදුලි සංදේශ නීති යාවත්කාලීන කිරීම

2024 අගභාගයේදී හේරත් මහතා අධ්‍යක්ෂ ජනරාල් ධූරයට පත්වන විට, ඔහුට වසර 22ක පමණ කාලයක් පැරණි විදුලි සංදේශ නියාමන රාමුවක් උරුම වී තිබුණි.

රටේ වේගයෙන්ම සංවර්ධනය වන විදුලි සංදේශ ක්ෂේත්‍රය නියාමනය කරන නීති, තාක්ෂණික දියුණුව සමඟ සමාන්තරව ඉදිරියට යාමට අසමත් වී තිබුණි. ලෝකයේ අනෙකුත් රටවල් 5G, සයිබර් ආරක්ෂණ ක්‍රමවේද සහ ඩිජිටල් ආර්ථිකයන් දෙසට වේගයෙන් ඉදිරියට යද්දී, ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමන පද්ධතිය බොහෝ දුරට පැරැණි යුගයකට සීමා වී තිබුණි. එබැවින් මෙහි ලා ඉක්මන් ප්‍රතිචාරයක් අවශ්‍ය විය.

ඔහුගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් මෙතෙක් සිදු කළ විශාලතම නීතිමය ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ආරම්භ කරන ලදී. ඒ යටතේ සංශෝධිත විදුලි සංදේශ පනත වේගයෙන් ක්‍රියාත්මක කරමින් නියාමන පද්ධතිය නවීකරණය කිරීම සඳහා රෙගුලාසි 18ක් හඳුන්වා දෙනු ලැබීය. එම ක්‍රියාවලියේදී විශේෂයෙන්ම සබ්මැරීන් කේබල් සම්බන්ධ නියාමන රීතිවල අඩුපාඩු පැවති බව පැහැදිලි විය.

ශ්‍රී ලංකාවේ අන්තර්ජාල ප්‍රවේශ සියල්ලම පාහේ ඉන්දියානු සාගරය හරහා ගමන් කරන මුහුදු සංදාම ෆයිබර් ඔප්ටික් කේබල් මත රඳා පැවතිය ද, ඒවා නියාමනය සඳහා පෙරදී පැහැදිලි නීතිමය රාමුවක් නොතිබුණි. එම හිඩැස ආර්ථිකමය මෙන්ම උපායමාර්ගික අවදානම් ද ඇති කළ බව හේරත් මහතා සඳහන් කළේය. "මෙම කේබල් හුදෙක් මුහුදු සංදාම වයර් පමණක් නොවේ; ඒවා රටේ ඩිජිටල් ආර්ථිකයේ ප්‍රධාන ජීවනාලියයි," යනුවෙන් ඔහු පැවසීය.

ශ්‍රී ලංකාව මේ වන විට රාජ්‍ය සහ පෞද්ගලික ක්‍රියාකරුවන්ට අයත් සබ්මැරීන් කේබල් පද්ධති කිහිපයක් මත රඳා පවතින අතර දේශීය සම්බන්ධතාවයට අමතරව ඒවා ආසියාව, මැදපෙරදිග සහ යුරෝපය සම්බන්ධ කරන විශාල කලාපීය ජාලයක කොටසක් ලෙස ද ක්‍රියා කරයි. නව නියාමන ප්‍රතිපාදන හරහා මෙම යටිතල පහසුකම් ආරක්ෂා කිරීමට පමණක් නොව, නඩත්තු සහ ජාත්‍යන්තර දත්ත ප්‍රවේශ සේවාවන් මඟින් ආදායම් උත්පාදනය කිරීම ද ශ්‍රී ලංකාවට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පාරිසරික කරුණු ද මේ ක්‍රියාවලියට එක්වෙමින් පවතී. අත්හැර දමා ඇති සබ්මැරීන් කේබල්වල සමුද්‍ර පරිසර පද්ධති සඳහා හානිදායක විය හැකි රසායනික ද්‍රව්‍ය හා වෙනත් ද්‍රව්‍ය අඩංගු විය හැකි අතර ඒ හේතුවෙන් අනාගත නියාමන රාමුවේ කොටසක් ලෙස පාරිසරික ආරක්ෂණ ක්‍රමවේද පිළිබඳ විමර්ශන ආරම්භ කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) කටයුතු කරයි.

■පස්වන පරම්පරාවේ (5G) රැහැන් රහිත සන්නිවේදනය දක්වා තාක්ෂණික සංක්‍රමණය

ශ්‍රී ලංකාවේ ඩිජිටල් අභිලාෂයන්ගේ ප්‍රධාන සන්ධිස්ථානයක් ලෙස 2024 දෙසැම්බර් මාසයේ 5G තාක්ෂණය නිල වශයෙන් හඳුන්වාදීම සැලකේ. වසර ගණනාවක් පුරා 5G පිළිබඳ සාකච්ඡා සහ පරීක්ෂණ සිදු වුවද, එය ක්‍රියාත්මක කිරීම විවිධ හේතු මත නැවත නැවතත් ප්‍රමාද විය. සංඛ්‍යාත වර්ණාවලිය වෙන්කිරීම මගින් රුපියල් බිලියන 16කට ආසන්න රාජ්‍ය ආදායමක් උපයා ගනිමින් හේරත් මහතා මෙම ක්‍රියාවලිය ඉදිරියට ගෙන ගියේය. ඔහු අවධාරණය කළේ 5G තාක්ෂණයේ සැබෑ වටිනාකම වේගවත් දත්ත බාගත කිරීම හෝ සමාජ මාධ්‍ය භාවිතය පහසු කිරීම පමණක් නොවන බවයි.

"5G තාක්ෂණය නිමක් නැති විනෝදාස්වාද භාවිතයට පමණක් සීමා නොවිය යුතුය, එය වඩාත් ප්‍රායෝගික හා අර්ථවත් අරමුණු සඳහා යොදා ගත යුතුය." පෙර ජංගම තාක්ෂණ පරම්පරාවන්ට සාපේක්ෂව, 5G හි ප්‍රධාන වාසිය වන්නේ අතිශය අඩු ප්‍රමාදතාවයයි—උපාංග හා ජාල අතර ඉතා වේගවත්, ආසන්න ක්ෂණික ප්‍රතිචාර ලබා දීමයි.

මෙම තාක්ෂණික හැකියාවන් හේතුවෙන් විවිධ පරිවර්තනීය ක්ෂේත්‍ර සඳහා නව දොරටු විවර වේ: දුරස්ථ රොබෝ ශල්‍යකර්ම හා වැඩිදියුණු දුරස්ථ වෛද්‍ය සේවා, තත්‍ය කාලීන ප්‍රතිචාර දක්වන නිරවද්‍ය කෘෂිකර්ම පද්ධති, සුහුරු නිෂ්පාදන හා කාර්මික ස්වයංක්‍රීයකරණය, වැඩිදියුණු තාක්ෂණය භාවිත කරන ඩිජිටල් ඉගෙනුම් පරිසරය හා දුරස්ථ අධ්‍යාපනය සහ බුද්ධිමත් ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණ පද්ධති ආදියයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) දැනටමත් 6G වැනි අනාගත පරම්පරා තාක්ෂණයන් සඳහා සූදානම් වීමේ ක්‍රියාවලියට පිවිස ඇත. 5G තාක්ෂණය තවමත් ගෝලීයව මුල් අවධියේ පවතින අතර ශ්‍රී ලංකාව 2025 සිට 2030 දක්වා කාලය තුළ සිදුවන ඩිජිටල් සංක්‍රාන්තිය සඳහා මාර්ග සිතියමක් සැලසුම් කිරීම ආරම්භකර තිබේ. මෙය ඩිජිටල් ක්ෂේත්‍රයේ වේගවත් පරිණාමය පිළිබඳ පැහැදිලි ඇඟවීමකි.

■වඩා ප්‍රශස්ත සේවාවක් සැපයීමෙහි ලා දරන ප්‍රයත්නයන්

වසර ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන පරිශීලකයින් ඇමතුම් බිඳවැටීම්, දුර්වල ජාල ආවරණය සහ අස්ථාවර අන්තර්ජාල වේගයන් නිසා නිරන්තර අසහනයට පත්ව සිටියහ. හේරත් මහතා විසින් මෙම ගැටලුව විවෘතව පිළිගෙන, සේවාවේ ගුණාත්මකභාවය අනුව රට ආසියාවේ පහළම මට්ටම් අතර සිටීම කනගාටුදායක කරුණක් ලෙස ප්‍රකාශ කළේය. ඔහුගේ මතයට අනුව, මෙම ගැටළුවට මූලික හේතුව වන්නේ වෙළඳපොළේ පවතින අසමතුලිතතාවය යි.

එක් ප්‍රධාන ක්‍රියාකරුවෙකු වෙළෙඳපොළේ සියයට 70කට ආසන්න කොටසක් පාලනය කරන අතර තවත් ප්‍රබල ක්‍රියාකරුවෙකු ද සැලකිය යුතු කොටසක් අත්පත් කරගෙන සිටී. මේ හේතුවෙන් කුඩා ක්‍රියාකරුවන්ට වෙළෙඳපොළ තුළ පැවැත්ම සුරක්ෂිත කරගැනීම අතිශය දුෂ්කර වී ඇත. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අදහස අනුව, මෙවැනි වෙළඳපොළ සාන්ද්‍රණය තරඟකාරිත්වය අඩු කරමින් සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ඇති උනන්දුව ද සීමා කරයි. එයට ප්‍රතිචාර වශයෙන්, ප්‍රමුඛ ක්‍රියාකරුවන්ගේ අසාධාරණ වෙළෙඳපොළ බලය පාලනය කිරීම සඳහා සැලසුම් කරන ලද "සුවිශේෂී වෙළෙඳපොළ බලය" පිළිබඳ රෙගුලාසි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් හඳුන්වා දී ඇත.

වඩාත් වැදගත් වන්නේ, නියාමන ආයතනය ක්‍රියාකරුවන් විසින් ලබා දෙන කාර්ය සාධන වාර්තා මත පමණක් විශ්වාසය නොතබා, තමන්ගේම ස්වාධීන අධීක්ෂණ යාන්ත්‍රණයක් ගොඩනැගීමට පියවර ගැනීමයි. "අපට ඔවුන් සපයන දත්ත මත පමණක් රඳා සිටිය නොහැක" ඔහු පැවසීය. බොහෝ අවස්ථාවල දත්ත හොඳම ආවරණය ඇති ප්‍රදේශවලින් ලැබෙන අතර වෙනත් ප්‍රදේශවල සාමාන්‍ය පරිශීලකයන් ගැටලු අත්විඳිති." එහි අරමුණ වන්නේ ස්වයං වාර්තාකරණයට වඩා ස්වාධීනව සේවා ගුණාත්මකභාවය තහවුරු කරන, වඩාත් විනිවිදභාවයෙන් යුත් පද්ධතියක් ස්ථාපිත කිරීමයි.

■නීතිවිරෝධී ජංගම දුරකථන වෙළඳාමට එරෙහිව කටයුතු කිරීම

හේරත් මහතාගේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයේ තවත් ප්‍රධාන අංශයක් වන්නේ ජංගම උපාංග නීතිවිරෝධී ලෙස ආනයනය කිරීම වැළැක්වීමයි. ඔහු පවසන පරිදි, මෙම ගැටලුව අහිමි වන බදු ආදායමට වඩා පුළුල් ආර්ථික හා සමාජීය බලපෑම් ඇති කරයි. අනවසර දුරකථන මිලදී ගන්නා පාරිභෝගිකයන්ට බොහෝ විට වගකීම් ආරක්ෂාවක් නොලැබේ. එවැනි නීතිවිරෝධී ආනයන අපරාධමය භාවිතයන්ට සහ අනීතික වෙළඳපොළ ක්‍රියාකාරකම්වලට ද අවස්ථා සලසා දෙන බව ඔහු අවධාරණය කරයි.

මෙයට විසඳුමක් ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් ස්වයංක්‍රීයව ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාව (IMEI) ලියාපදිංචි කිරීමේ හා අවහිර කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කරයි. සෑම නීත්‍යානුකූල ජංගම උපාංගයකටම ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා (IMEI) අංකයක් තිබෙන අතර නව නියාමන රාමුව යටතේ සොරකම් කළ හෝ නීතිවිරෝධී ලෙස ආනයනය කළ උපාංග දේශීය ජාල තුළ භාවිතයට නොහැකි වන තත්ත්වයට පත් විය හැකිය. ඒ සමඟම ග්‍රාහක නියාමනය ද දැඩිකර ඇත. eSIM සක්‍රීය කිරීමේදී අනන්‍යතා සත්‍යාපන ක්‍රියාවලීන් ශක්තිමත් කරඇති අතර එක් පුද්ගලයෙකුට හිමි විය හැකි සිම් කාඩ්පත් ගණනට ද සීමා පැනවී ඇත. තවද රජයේ දත්ත පද්ධති සමඟ ස්වයංක්‍රීය සම්බන්ධතා මඟින් මියගිය පුද්ගලයන්ට හෝ කල් ඉකුත් වූ වීසා හිමියන්ට අයත් සිම් ඇතුළු අක්‍රිය හෝ වංචනීය ලියාපදිංචි කිරීම් හඳුනා ගැනීමට ද සැලසුම් කරඇත.

■ග්‍රාමීය ප්‍රදේශ සඳහා විදුලි සංදේශ සේවා සැපයීමේ විෂමතාවයන් තුරන් කිරීම

නාගරික ඩිජිටල්කරණය වේගයෙන් වර්ධනය වුවද, බොහෝ ග්‍රාමීය ප්‍රජාවන් තවමත් සම්බන්ධතා නිසි ලෙස නොලැබීම නිසා පීඩා විඳිති. එම විෂමතාවය අවම කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ දිගුකාලීන දැක්මේ ප්‍රධාන අරමුණක් ලෙස සැලකේ. "ගමට සන්නිවේදනය" වැඩසටහන යටතේ, සංවර්ධන අරමුදල් මඟින් රුපියල් බිලියන ගණනක් භාවිත කරමින් අඩු ආවරණයක් ඇති ප්‍රදේශවල විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම සඳහා ආයෝජනය කරඇත. ඒ සමඟම, සමුද්‍රීය සන්නිවේදන ක්ෂේත්‍රයද වැඩි අවධානයකට ලක්වෙමින් පවතී.

මුහුදේ ආරක්ෂාව සහ සම්බන්ධීකරණය සඳහා බහුදින ධීවර යාත්‍රා දහස් ගණනක් ගුවන් විදුලි සන්නිවේදනය මත දැඩි ලෙස රඳා පවතී. කලින් කොළඹට පැමිණ දිගුකාලීන බලපත්‍ර ක්‍රියාවලීන් සිදු කිරීමට සිදු වූ තත්ත්වය දැන් විමධ්‍යගතකර ඩිජිටල්කරණය කරඇති අතර ගාල්ල සහ යාපනය වැනි ප්‍රදේශවල ධීවරයන්ට දේශීයව හෝ මාර්ගගතව සේවාවන් ලබා ගැනීමට හැකි වී ඇත. සමාජීය වශයෙන් වඩාත් වැදගත් මුලපිරීම වන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයයි. අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව රට පුරා ද්විතීයික පාසල් 6,000ක් සඳහා ෆයිබර් ඔප්ටික් අන්තර්ජාල පහසුකම් ලබා දීමේ කටයුතු පුළුල් කරමින් සිටී. පසුගිය වසරේ පමණක් පාසල් 1,300කට අධික සංඛ්‍යාවකට සම්බන්ධතාවය ලබා දී ඇත. හේරත් මහතා පෙන්වා දෙන්නේ මෙම බලපෑම පාසල්වලට පමණක් සීමා නොවී මුළු ග්‍රාමීය ප්‍රජාවටම විහිදෙන බවයි. "පාසලකට ෆයිබර් සම්බන්ධතාවය ලැබූ විට, එය සමස්ත ගමටම ඩිජිටල් ප්‍රවේශය ලබා දෙන දොරටුවක් බවට පත්වේ," යි ඔහු පැවසීය. මේ අනුව, පාසල් ග්‍රාමීය ප්‍රදේශවල ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ප්‍රධාන මධ්‍යස්ථාන ලෙස ක්‍රියා කරමින්, අධ්‍යාපනයට අමතරව සමාජ හා ආර්ථික පරිවර්තනය ද වේගවත් කරයි.

■ස්ථාවර ඩිජිටල් අනාගතයක් කරා

ශ්‍රී ලංකාව ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය සමරන අවස්ථාවේදී, රට පැහැදිලි ඩිජිටල් සන්ධිස්ථානයකට පිවිසෙමින් සිටී. විදුලි සංදේශ තවදුරටත් ද්විතීයික සේවාවක් නොවී, ආර්ථික ස්ථායීතාවය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, පාලනය සහ මහජන විශ්වාසය හැඩගස්වන මූලික සාධකයක් බවට පත්ව ඇත. මහනුවර, මාතර, මඩකලපුව, යාපනය සහ අනුරාධපුර යන නගරවල නව ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ගත් සැලසුම් මඟින්, නියාමන සේවාවන් සාමාන්‍ය ජනතාවට වඩාත් සමීප කරවීමේ උත්සාහය පැහැදිලි වේ. කලින් කොළඹට සීමා වූ බොහෝ සේවාවන් දැන් රට පුරා විමධ්‍යගත වෙමින් පවතී. හේරත් මහතාගේ අදහස අනුව, මෙම සියලු ප්‍රයත්නයන් අවසානයේ තාක්ෂණයට වඩා ජනතාවට ප්‍රමුඛත්වය දෙන මෙහෙවරක් ලෙස සැලකිය යුතුය.

කේබල්, කුළුණු, චන්ද්‍රිකා සහ ෆයිබර් ජාල වැනි යටිතල පහසුකම් සංවර්ධනය කළ හැකි වුවද, සැබෑ ඉලක්කය වන්නේ භූගෝලීය පිහිටීම, සමාජ වරප්‍රසාද හෝ බලපෑම් මත අවස්ථා සීමා නොවන, සෑම අයෙකුටම සමානව සම්බන්ධ විය හැකි සමාජයක් ගොඩනැගීමයි. ඩිජිටල් ස්ථායීතාවය වැඩි වශයෙන් අර්ථ දක්වමින් පවතින මෙම යුගයේ, ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය තවදුරටත් ස්ථාවර සංඥා ලබාදීම පමණක් නොව, ශක්තිමත් පද්ධති, ශක්තිමත් ආයතන සහ අවසානයේ ශක්තිමත් ජාතියක් නිර්මාණය කිරීම පිළිබඳ පුළුල් කතිකාවක් බවට පරිවර්තනය වී ඇත.

ඩිජිටල් සම්බන්ධතා ඔස්සේ බැඳුණු ජාලගත ලෝකයක් සඳහා 5G තාක්ෂණයේ දායකත්වය

ඩිජිටල් සම්බන්ධතාව යනු මිනිස් ජීවිතයේ පැවැත්ම, ස්ථාවරත්වය සහ යහපැවැත්ම පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වන මූලික ආධාරකයකි. විශේෂයෙන් අර්බුදකාරී අවස්ථාවලදී එහි වැදගත්කම තවදුරටත් ඉස්මතු වේ. සෞඛ්‍ය, ආර්ථික, දේශපාලනික සහ ස්වාභාවික අභියෝග රැසකට මුහුණ දී ඇති අපට අනෙක් පද්ධති බිඳ වැටෙන අවස්ථාවල ඩිජිටල් සම්බන්ධතාවල වටිනාකම මැනවින් අවබෝධ වේ. මෙවර ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය "ඩිජිටල් සම්බන්ධතා ඔස්සේ බැඳුණු ජාලගත ලෝකයක ස්ථාවරත්වය ශක්තිමත් කිරීම" යන තේමාව යටතේ සමරනු ලබයි. එමඟින් වර්තමාන සමාජයේ ඩිජිටල් සම්බන්ධතාව විදුලිය, ප්‍රවාහනය සහ අනෙකුත් මූලික සේවාවන් මෙන්ම අත්‍යවශ්‍ය අංගයක් බව අවධාරණය කරයි.

සෞඛ්‍ය, අධ්‍යාපනය, වාණිජ්‍ය සහ රාජ්‍ය පාලනය වැනි ක්ෂේත්‍ර රැසක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මත වැඩි වශයෙන් රඳාපවතින ශ්‍රී ලංකාවේ, 5G තාක්ෂණය සාමාන්‍ය ජාල නවීකරණයකට වඩා වැඩි වැදගත්කමක් දරයි. එය ජාතික ස්ථායීතාව ශක්තිමත් කිරීමටත්, ආර්ථික හා සමාජීය සංවර්ධනය කඩිනම් කිරීමටත් දායක වන මූලික පදනමකි. තවද, 5G තාක්ෂණය ඩිජිටල් පරතරය අවම කිරීමට, ජනතාවගේ ජීවනෝපායන් ශක්තිමත් කිරීමට සහ රාජ්‍ය සේවා සැපයීමේ ක්‍රමවේද නවීකරණය කිරීමට වැදගත් භූමිකාවක් ඉටුකරයි.

දිට්වාසුළි කුණාටුවෙන් හෙළිවූ ආපදා කළමනාකරණයේ දිගුකාලීන සැලසුම්වල අවශ්‍යතාව

දිට්වා සුළි කුණාටුව මඟින් ශ්‍රී ලංකාවේ ජාතික ආපදා කළමනාකරණ උපාය මාර්ගවලට 5G තාක්ෂණය මත පදනම් වූ ජාල ස්ථායීතාව ඇතුළත් කිරීමේ අවශ්‍යතාව පැහැදිලිව පෙන්නුම් කරඇත. විදුලි සැපයුම බිඳවැටීම සහ විදුලි සංදේශ යටිතලපහසුකම් හානි වීම හේතුවෙන් ගංවතුර හා නායයෑම් වැනි අවස්ථාවල ප්‍රජාවන් සම්බන්ධතාවයෙන් වෙන්වීම, ගලවා ගැනීමේ කටයුතු ප්‍රමාදවීම සහ පවුල් අතර සම්බන්ධතා බිඳවැටීම සිදුවිය. එමඟින් හදිසි ආපදා අවස්ථා වලදී ජනතාවට තොරතුරු, ආරක්ෂාව, පවුල් සම්බන්ධතා සහ සහාය ලබා ගැනීමට ඩිජිටල් සම්බන්ධතාව අත්‍යවශ්‍ය බව තවදුරටත් තහවුරු විය.

5G සක්‍රීය ජාල මගින් ඩිජිටල් ස්ථායීතාව වැඩිදියුණුකර ප්‍රතිස්ථාපනය කළ හැක. උපාංග සමඟ සෘජුවම සන්නිවේදනය කිරීමට ඉඩ සලසන රැහැන් රහිත තාක්ෂණය(Device to device (D2D)සන්නිවේදනය) හා එකිනෙකා සමඟ සෘජුවම සන්නිවේදනය කරන විමධ්‍යගත ජාලයක් නිර්මාණය කිරීම (mesh type connectivity) මඟින් ජාලයේ කොටස් අක්‍රීය වූ අවස්ථාවලදී පවා උපාංග අතර අත්‍යවශ්‍ය තොරතුරු හුවමාරු කිරීමට හැකියාව ලැබේ. එසේම Network slicing යන 5G තාක්ෂණය මගින් එකම භෞතික ජාලය තුළ විවිධ අථත්‍ය ජාල නිර්මාණය කළ හැකි බැවින්, හදිසි සේවාවන්ට වැඩි ප්‍රමුඛතාවක් ලබාදිය හැකිය. එමඟින් ජාලය අස්ථාවර වුවද ආපදා අවස්ථා වලදී පළමුව ප්‍රතිචාර දක්වන සහායක කණ්ඩායම් වලට සන්නිවේදනය පවත්වාගෙන යාමට, පුද්ගලයන් ඉවත් කිරීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමට සහ අතුරුදන් වූ පුද්ගලයින් සොයා ගැනීමට පහසුකම් සපයයි. තවද, 5G සම්බන්ධිත සංවේදක හා ඩ්‍රෝන මගින් වර්ෂාපතනය, ගංගා ජල මට්ටම් සහ නායයෑම් අවදානම් පිළිබඳ තත්‍ය කාලීන දත්ත ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබාදිය හැකි අතර එය AI පදනම් වූ පද්ධති භාවිතකර අනතුරු ඇඟවීම් ඉක්මනින් ලබාදීමටත්, හදිසි ප්‍රතිචාර දැක්වීමේ කාලය අඩු කිරීමටත් උපකාරී වේ.

නව තාක්ෂණය, වෙළඳපොළ හා සමාජ ආර්ථික ප්‍රවණතා මත පැනනගින නව ජීවනෝපායයන්

5G තාක්ෂණය තිරසාර ආර්ථික වර්ධනය සඳහා වැදගත් සාධකයකි. එය කෘෂිකර්මාන්තයේ සිට විනෝදාස්වාදය දක්වා විවිධ ක්ෂේත්‍ර විවර කරමින් නව රැකියා හා ඩිජිටල් ජීවනෝපායන් ඇති කරයි. 5G ජාල සංවර්ධනය සඳහා කුසලතා ඇති කාර්මිකයන්, සැලසුම්කරුවන් සහ දත්ත ඉංජිනේරුවන්ගේ අවශ්‍යතාව ද ඉහළ ය. අධ්‍යයනවලට අනුව, නැගී එන ආර්ථිකයන්හි 5G මගින් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ දිගුකාලීනව එහි ආයෝජන පිරිවැයට වඩා බෙහෙවින් වැඩි විය හැකි අතර එමඟින් ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභ කාර්මික අංශයේ ඩිජිටල් පරිවර්තනය සහ ඩිජිටල් තාක්ෂණය සහ නවෝත්පාදන භාවිත කරමින් ග්‍රාමීය ප්‍රදේශවල ජීවන තත්ත්වය, සේවා සහ ආර්ථික අවස්ථා වැඩිදියුණු කිරීම තුළින් ලැබේ.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා 5G තාක්ෂණය වැදගත් පරිවර්තනයක් ඇති කරයි. මන්දගාමී බ්‍රෝඩ්බෑන්ඩ් මත රඳා පවතින ව්‍යාපාරවලට මෙය ඩිජිටල් මෙවලම්, මාර්ගගත වෙළෙඳපොළවල් සහ ගෝලීය සැපයුම් ජාල වෙත පහසු ප්‍රවේශයක් ලබා දෙයි. තන්තු ජාල සහ පොදු යටිතල පහසුකම් වැනි ජාතික ඩිජිටල් ව්‍යාප්ති ක්‍රියාමාර්ග සමඟ ඒකාබද්ධ වූ විට, 5G ග්‍රාමීය ජීවනෝපායයන් පවත්වාගෙන යාමට සහ දේශීය ආර්ථික සම්බන්ධතා ශක්තිමත් කිරීමට උපකාරී වන ප්‍රධාන මාධ්‍යයක් බවට පත්වේ.

නිරෝගී හා යහපත් සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් බිහි කිරීම

5G තාක්ෂණය මඟින් ප්‍රජා සෞඛ්‍ය සහ යහපැවැත්ම සැලකිය යුතු ලෙස දියුණු වේ. සම්බන්ධිත පැළඳිය හැකි ඉලෙක්ට්‍රොනික උපාංග මඟින් පුද්ගලයන්ගේ සෞඛ්‍ය තත්ත්වය නිරන්තරයෙන් නිරීක්ෂණයකර, සායන හෝ ඩිජිටල් සෞඛ්‍ය පද්ධති වෙත තත්‍ය කාලීනව දත්ත යැවීමෙන් වෛද්‍ය උපදේශන හා සේවා කාර්යක්ෂමව සිදු කළ හැකි අතර, සෞඛ්‍ය ගැටළු කලින් හඳුනා ගැනීමට ද ඉඩ සලසයි. ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශවල වීඩියෝ උපදේශන, AI මත පදනම් වූ රෝග විනිශ්චය සහ ජංගම සෞඛ්‍ය සේවා ඒකක මඟින් නිවාස හා පාසල් වෙත රෝග නිවාරණ සත්කාරක සේවා සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ සෘජුවම ලබාදිය හැකිය.

5G හරහා දුරස්ථව සිදුකරන ව්‍යායාම පන්ති සහ සෞඛ්‍ය සුවතා අභ්‍යාස මගින් ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කළ හැකි අතර එමඟින් ශ්‍රී ලාංකික තරුණයින් සහ වැඩිහිටියන් අතර බෝ නොවන රෝග අඩු කිරීමට සහ සෞඛ්‍යය සම්පන්න ක්‍රියාශීලී හා ශක්තිමත් ප්‍රජාවක් බිහි කිරීමට 5G දායක වනු ඇත.

අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා සිදුකරන පරිපාලනමය තීරණ

රජයන්ට 5G ජාල ක්‍රියාත්මක කිරීම තුළින් වඩා කාර්යක්ෂමව, විනිවිදභාවයෙන් යුතු කඩිනම් මහජන සේවාවක් ලබාදිය හැකිය. පුද්ගලයන් හඳුනා ගැනීමේ ඩිජිටල් පද්ධති, මාර්ගගතව බදු ගොනු කිරීම, විද්‍යුත් ප්‍රසම්පාදනය සහ තත්‍ය කාලීන ව්‍යාපෘති අධීක්ෂණය කිරීමත් මඟින් දූෂණය අඩුකර වගවීම වැඩිදියුණු කළ හැකිය. එමඟින් මහජන සේවා ප්‍රමාදයකින් තොරව ජනතාව වෙත ලබාදීමටත්, රජය හා පුරවැසියන් අතර විශ්වාසය ශක්තිමත් කිරීමටත් 5G උපකාරී වේ.

මෙහිදී සිදුවිය හැකි අවදානම් වලක්වා ගැනීමට ශක්තිමත් දත්ත ආරක්ෂණ නීති, පැහැදිලි සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ ප්‍රතිපත්ති සහ ස්වාධීන අධීක්ෂණය අතර සමතුලිතතාවයක් අවශ්‍ය වේ.

5G ක්‍රියාත්මක කිරීමේ දී පැන නගින බලපෑම් සහ අවහිරතා

5G පිළිබඳ වැඩි ප්‍රචාරයක් තිබුණ ද, පැහැදිලි ඉල්ලුමක් සහ සාර්ථක භාවිත අවස්ථා නොමැති නිසා දුරකථන සමාගම් 5G සඳහා ආයෝජනය කිරීමට තවමත් පසුබට වේ. ඒ සමඟම, ජාලය විශ්වාසදායකව සහ සාධාරණ මිලකට ලබාදෙන තුරු පරිශීලකයින්ද 5G සේවා භාවිතයට වැඩි උනන්දුවක් නොදක්වයි. ඉහළ යටිතල පහසුකම් වියදම්, නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ අතර පවතින සේවා පහසුකම් අසමානතා සහ ග්‍රාමීය ආවරණයට අවශ්‍ය අඩු කලාප 5G සංඛ්‍යාත වර්ණාවලියේ හිඟය ද ප්‍රධාන බාධක වේ. විශේෂයෙන් AI යුගයේ, විශාල දත්ත ප්‍රමාණයක් කාර්යක්ෂම තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන බැවින්, 5G හි සම්පූර්ණ ප්‍රතිලාභ ලබාගත හැක්කේ උපාංග සහ පරිශීලක භාවිතය පුළුල් වූ විට පමණි.

ඒ සඳහා වැදගත් ස්ථානවල 5G ක්‍රියාත්මක කිරීම හා සැබෑ ප්‍රතිලාභ පෙන්වන නියමු ව්‍යාපෘති ආරම්භ කිරීම කළ යුතුය.

5G තාක්ෂණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

5G තාක්ෂණය පිළිබඳ දැනුවත්භාවය සහ අධ්‍යාපනය ඉහළ නැංවීම, එය ජාල යෙදවීම තරම්ම වැදගත් කරුණකි. සාමාන්‍යයෙන් 5G යනු ඉතා වේගවත් ජංගම අන්තර්ජාලයක් ලෙස පමණක් දකින අතර එහි සැබෑ ශක්‍යතාවන් බොහෝවිට අවබෝධකර නොගනී. දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් 5G පිළිබඳ ඇති වැරැදි අදහස් හා අනවබෝධතා ඉවත්කර දෛනික ජීවිතයට සහ ආර්ථික ක්‍රියාකාරකම්වලට 5G දායක වන ආකාරය පැහැදිලි කළ හැකිය. 5G මත පදනම් වූ ක්ෂේත්‍රවල වර්ධනය සමඟම, ඒවාට අදාළ තාක්ෂණ විශේෂඥයින් සඳහා ඉල්ලුම ද වැඩිවන බැවින් ඒ සඳහා අවශ්‍ය දේශීය දක්ෂතා ගොඩනැගීමට තාක්ෂණික හා වෘත්තීය පුහුණුව අවශ්‍ය වේ. තරුණ විරැකියාව ඉහළ මට්ටමක පවතින සහ ඩිජිටල් පරතරය තවමත් පවතින ශ්‍රී ලංකාව වැනි රටක, 5G ආශ්‍රිත අධ්‍යාපනයට සහ කුසලතා සංවර්ධනයට ආයෝජනය කිරීම, ශ්‍රම බලකාය ඩිජිටල් ආර්ථිකයට සාර්ථකව සම්බන්ධ කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

මහාචාර්ය දිලීකා ඩයස්